# දුම්රිය දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය -2 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය.

**01.** සම්බන්ධ වන ආයතන:

1.1 දෙපාර්තමේන්තුව : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
යොමුඅංකය : **GMA/SOR/MT-02** දිනය: **2016.10.10**

1.2 අමාත්‍යාංශය :ප්‍රවාහන අමාත්‍යාංශය
යොමු අංකය : MT/03/12/01/02/MT/02 දිනය : 2016.11.07

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්
විසින් තනතුරු අනුමත කිරීම :

| | |
|---|---|
| යොමුඅංකය : **DMS/F2/DR/01** | දිනය : **2013.04.09** |
| යොමුඅංකය : **DMS/1142** | දිනය : **2014.04.30** |
| යොමුඅංකය : **DMS/1142/V-II** | දිනය : **2015.03.19** |
| යොමුඅංකය : **DMS/1142/V-II** | දිනය : **2015.07.08** |

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය : EST-2/REC/02/1285 දිනය : 2016.05.17

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NSCC/ 02/43/SR දිනය : 2016.07.18

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමු අංකය : PSC/EST/04-01-43/09/2016 දිනය : 2017.06.15
පළමුවන සංශෝධිත දිනය: 2017.09.14
දෙවන සංශෝධිත දිනය: 2017.10.10

**02.** පත්කිරීම් බලධරයා **:** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද දුම්රිය සාමාන්‍යාධිකාරී

**03.** සේවා ගණය පිළිබඳ විස්තර :

3.1 සේවාගණය : කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය -2

3.2 ශ්‍රේණි : III, II හා I ශ්‍රේණි

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයන්හි විධායක, කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් විශේෂිත තාක්ෂණික නිපුණතාවයන්,එනම් තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) මට්ටම හය (6) යටතට ගැනෙන්නා වූ ද පාඨමාලා කාල සීමාව මාස 13 සහ 24 අතර වූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා හිමිකර ගත යුතු නිපුණතා අවශ්‍ය වන කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

3.4 කාර්යයන් පැවරීම.

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවා අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04.** තනතුරෙහි / තනතුරුවල ස්වභාවය :ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත.

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.)

**05.** වැටුප්:

5.1 වැටුප් කේත අංකය :MT– 02– 2016

5.2 මාසික වැටුප් පරිමාණය :රු.30,140-10X350 -11X370-10X560-10X660-49,910/-

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය(රු.) |
|---|---|---|
| III | පියවර 01 | 30,140/- |
| II | පියවර 12 | 34,010/- |
| I | පියවර 23 | 38,270/- |

සටහන :
2016 සිට 2020 දක්වා වැටුප් ගෙවිය යුත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 උපලේඛන II හි සඳහන් පරිදි විය යුතුය.

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| [illegible] තනතුරු [illegible] | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| [illegible] ණික [illegible] | III, II ,I ශ්‍රේණිය | 1442 | • කර්මාන්තශාලා තුලදී දුම්රිය එන්ජින්,ගැල් හා මැදිරි/යන්ත්‍ර සූත්‍ර වාහන පරීක්ෂා කර බලා අළුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම, ඒවායේ සේවා කටයුතු, අළුත්වැඩියා හා නඩත්තු කටයුතු වලට අදාල සියළු ආකාරයේ එන්ජින් හා යන්ත්‍ර කොටස් වශයෙන් ගැලවීම, පිරිද්දීම , සවි කිරීම ,එකලස් කිරීම හා යථා තත්ත්වයට පත් කිරීම.දුම්රිය ධාවනයේදී ක්‍රියා විරහිතවන එන්ජින් දුම්රිය මාර්ගයේදී හෝ ධාවනාගාරයේදී අළුත්වැඩියා කිරීමට කටයතු කිරීම, දුම්රිය ප්‍රමාදයන් හෝ අවලංගු වීම් වැලැක්වීමට අවශ්‍ය නියමිත අමතර කොටස් සපයා ගැනීමේ දුෂ්කරතාවයන් පැනනැගී ඇතිවිට අධීක්ෂණ කළමණාකරුවන් හා ඉහළ නිලධාරීන් විසින් ලබා දෙන උපදෙස් පරිදි සුදුසු විකල්ප ක්‍රම අනුව අදාළ අළුත්වැඩියා කටයුතු සිදු කර දුම්රිය එන්ජින් යන්ත්‍ර ධාවනයට සුදුසු පරිදි සකස් කිරීම.අවශ්‍ය අවස්ථාවලදී නඩත්තුව සඳහා අවශ්‍ය වන අමතර කොටස් හදුනා ගැනීම,ලැයිස්තු සකස් කිරීම සපයා ගැනීමට අධීක්ෂණ කළමණාකරුවන්ට හා ඉහළ නිලධාරීන්ට සහය වීම. කාර්මික හා වර්ණ සංඥා වලට අදාල යාන්ත්‍රික පද්ධති සවි කිරීම , නඩත්තුව හා අළුත්වැඩියාව , දෝෂ වූ කොටස් අළුත්වැඩියාව සහ අමතර කොටස් නිෂ්පාදනය සම්බන්ධ සියළු කටයුතු.අධීක්ෂණ කළමනාකරු හා ඉහල නිලධාරීන් විසින් පවරනු ලබන වෘත්තියට අදාල හදිසි රාජකාරි කටයුතු ඉටු කිරීම.<br>• ඉහත අළුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හා නැවත සවි කිරීම් වලදි අවශ්‍ය වන අමතර කොටස් හා උපාංග වල මිම් සලකුණු තැබීම හා ඒවා යන්ත්‍රණය කොට නිෂ්පාදනය කිරීම.<br>• එන්ජින්, බලවේග කට්ටල, ගැල් හා මැදිරි , යන්ත්‍ර හා යන්ත්‍රෝපකරන හා බොයිලේරු වල සැකිලි හා තහඩු ආවරණ සැකසීම හා අළුත්වැඩියාව, ලෝහමය කොටස් නිෂ්පාදනය,අවශ්‍ය ජිග් හා ෆික්චර්ස් හා අච්චු නිෂ්පාදනය,ලෝහමය කොටස් කැපීම ,සැකසීම හා පැස්සීම,විදුලි කැපීම හා ඒසඳහා අවශ්‍ය උපකරණ සකසා ගැනීම. |

| | | | |
|---|---|---|---|
| දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර(පරිපාලක) | III, II හා I ශ්‍රේණිය | 310 | • තමාට අයත් සේවා අංශයේ, ධාවනාගාරයේ,කර්මාන්ත ශාලාවේ හෝ වැඩ බිමේ හෝ සංඥා අංශයේ ඉහළ කළමණාකරුවන් හා අධීක්ෂණ කළමනාකරුවන් විසින් නියම කරනු ලබන වෘත්තියට අදාල සියළුම කාර්යයන් නියම ආකාරයෙන් සපුරා ගැනීම සඳහා තම අංශයේ සේවක පිරිස් යෙදවීම, මෙහෙයවීම හා ඔවුන් විසින් ඉටු කරනු ලබන කාර්යයන් පිළිබඳව මනා පරීක්ෂාවකින් යුතුව කටයුතු කිරීම,අවශ්‍ය උපදෙස් ලබා දීම හා අළුත්වැඩියාව නිමවූ පසු අළුත්වැඩියාව නියමාකාරයෙන් සිදුකර ඇති බව වාර්තා කිරීම හා අදාල ලේඛන ඉදිරිපත් කිරීම. භාවිතා කරනු ලබන මෙවලම් හා උපකරණවල යෝග්‍යතාවය පිළිබඳව අවබෝධයකින් කටයුතු කිරීම.<br>• කර්මාන්තශාලා සංකීර්ණය තුල සිදුකරනු ලබන නිෂ්පාදන අළුත්වැඩියා හා නඩත්තු කටයුතු වල අවශ්‍ය වැඩපත් හා ඇස්තමේන්තු අංශභාර ඉංජිනේරුවරුන්ගේ හා අධීක්ෂණ කළමනාකරුවන්ගේ උපදෙස් පරිදි පිළියෙල කර ඉදිරිපත් කිරීම ,නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ඇනවුම් කිරීමට කටයුතු යෙදීම.පිරිවිතර විස්තර සැපයීම හා ගබඩා අංක සැපයීම.දුම්රිය එන්ජින් ගැල් මැදිරි හා යන්ත්‍රසුත්‍ර වල අළුත්වැඩියාව හා නඩත්තු කටයුතු පිළිබඳව ලේඛන පවත්වාගෙන යාම නිෂ්පාදන ඉලක්ක හා භාණ්ඩ සැපයීම සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම. |
| දුම්රිය තාක්ෂණික කළමණාකරන සහකාර (උපදේශක) | III, II හා I ශ්‍රේණිය | 13 | ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයෙහි පවත්වනු ලබන පාඨමාලා  සඳහා සහභාගී වන පුහුණුවන්නන් සඳහා පාඨමාලා පැවැත්වීම,එකී පුහුණු පාඨමාලා සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ඇණවුම් කිරීම,පාඨමාලා සඳහා අවශ්‍ය කරනු ලබන ගුරු ආධාරක පිළියෙළ කිරීම හා ඇගයීම, බඳවා ගැනීම් සිදු කිරීමේදී එකී සියලු කටයුතු වලට සහාය වීම,අනෙකුත් උප දෙපාර්තමේන්තු වලට අවශ්‍ය වන අමතර කොටස් අළුත්වැඩියාව හා නිෂ්පාදනය , අනෙකුත් විශේෂ රාජකාරිවල යෙදීම |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

| අනුමතතනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (යාන්ත්‍රික) | III, II හා I ශ්‍රේණිය | 1442 |
| දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (විදුලි) | III, II හා I ශ්‍රේණිය | 306 |
| දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (පරීක්ෂක) | III, II හා I ශ්‍රේණිය | 114 |
| දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර(පරිපාලක) | III, II හා I ශ්‍රේණිය | 310 |
| දුම්රිය තාක්ෂණික කළමණාකරණ සහකාර (උපදේශක) | III, II හා I ශ්‍රේණිය | 13 |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III, II හා I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

| | | | |
|---|---|---|---|
| දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර(පරිපාලක) | III, II හා I ශ්‍රේණිය | 310 | • තමාට අයත් සේවා අංශයේ, ධාවනාගාරයේ,කර්මාන්ත ශාලාවේ හෝ වැඩ බිමේ හෝ සංඥා අංශයේ ඉහළ කළමණාකරුවන් හා අධික්ෂණ කළමනාකරුවන් විසින් නියම කරනු ලබන වෘත්තියට අදාල සියළුම කාර්යයන් නියම ආකාරයෙන් සපුරා ගැනිම සඳහා තම අංශයේ සේවක පිරිස් යෙදවීම, මෙහෙයවීම හා ඔවුන් විසින් ඉටු කරනු ලබන කාර්යයන් පිළිබඳව මනා පරීක්ෂාවකින් යුතුව කටයුතු කිරිම,අවශ්‍ය උපදෙස් ලබා දිම හා අළුත්වැඩියාව නිමවූ පසු අළුත්වැඩියාව නියමාකාරයෙන් සිදුකර ඇති බව වාර්තා කිරිම හා අදාල ලේඛන ඉදිරිපත් කිරීම. භාවිතා කරනු ලබන මෙවලම් හා උපකරණවල යෝග්‍යතාවය පිළිබඳව අවබෝධයකින් කටයුතු කිරිම.<br>• කර්මාන්තශාලා සංකීර්ණය තුල සිදුකරනු ලබන නිෂ්පාදන අළුත්වැඩියා හා නඩත්තු කටයුතු වල අවශ්‍ය වැඩපත් හා ඇස්තමේන්තු අංශභාර ඉංජිනේරුවරුන්ගේ හා අධීක්ෂණ කළමනාකරුවන්ගේ උපදෙස් පරිදි පිළියෙල කර ඉදිරිපත් කිරිම ,නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ඇනවුම් කිරීමට කටයුතු යෙදීම.පිරිවිතර විස්තර සැපයීම හා ගබඩා අංක සැපයීම.දුම්රිය එන්ජින් ගැල් මැදිරි හා යන්ත්‍රසූත්‍ර වල අළුත්වැඩියාව හා නඩත්තු කටයුතු පිළිබඳව ලේඛන පවත්වාගෙන යාම නිෂ්පාදන ඉලක්ක හා භාණ්ඩ සැපයිම සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරිම. |
| දුම්රිය තාක්ෂණික කළමණාකරන සහකාර (උපදේශක) | III, II හා I ශ්‍රේණිය | 13 | ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයෙහි පවත්වනු ලබන පාඨමාලා සඳහා සහභාගී වන පුහුණුවන්නන් සඳහා පාඨමාලා පැවැත්විම,එකී පුහුණු පාඨමාලා සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ඇණවුම් කිරිම,පාඨමාලා සඳහා අවශ්‍ය කරනු ලබන ගුරු ආධාරක පිළියෙළ කිරීම හා ඇගයීම, බඳවා ගැනීම් සිදු කිරිමේදී එකී සියලු කටයුතු වලට සහාය වීම,අනෙකුත් උප දෙපාර්තමේන්තු වලට අවශ්‍ය වන අමතර කොටස් අළුත්වැඩියාව හා නිෂ්පාදනය , අනෙකුත් විශේෂ රාජකාරිවල යෙදීම |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

| අනුමතතනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (යාන්ත්‍රික) | III, II හා I ශ්‍රේණිය | 1442 |
| දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (විදුලි) | III, II හා I ශ්‍රේණිය | 306 |
| දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (පරීක්ෂක) | III, II හා I ශ්‍රේණිය | 114 |
| දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර(පරිපාලක) | III, II හා I ශ්‍රේණිය | 310 |
| දුම්රිය තාක්ෂණික කළමණාකරණ සහකාර (උපදේශක) | III, II හා I ශ්‍රේණිය | 13 |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III, II හා I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය:

### 7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 50% |
| සීමිත | 50% |

**සංලක්ෂය :-**

දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (යාන්ත්‍රික) සහ දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (විදුලි) තනතුරු සඳහා බඳවා ගැනීමේදී විවෘත තරග විභාගයක් පවත්වා ඉන් සමත්වන අයදුම්කරුවන් ලබා ගන්නා ලද ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. විවෘත තරග විභාගයෙන් බඳවා ගනු ලබන ප්‍රතිශතය වන 50% තුළ තෝරා ගැනීම සඳහා ප්‍රමාණවත් සංඛ්‍යාවක් සමත් නොවුවහොත් එම ඉතිරි පුරප්පාඩු සීමිත පදනම මත විභාගය සමත් වූ අයදුම්කරුවන් ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරවනු ලැබේ. සීමිත පදනම මත බඳවාගනු ලබන ප්‍රතිශතය වන 50% තුළ තෝරා ගැනීම සඳහා ප්‍රමාණවත් සංඛ්‍යාවක් සමත් නොවුවහොත් එම ඉතිරි පුරප්පාඩු ප්‍රමාණය විවෘත තරග විභාගය සමත් වුවන්ගෙන් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරවනු ලැබේ.

### 7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගැනීම : ප්‍රථමයෙන්ම වසරක පුහුණුවක කාලසීමාවක් සඳහා බඳවා ගෙන එම පුහුණුව සාර්ථකව නිම කරන නිලධාරීන් III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

7.2.2 සුදුසුකම් : පුහුණු කාලසීමාවට බඳවා ගැනීම සඳහා සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමර්ථයන් සහිතව එක් වරකදී විෂයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවෙන් සියළුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීයික අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.(පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

සටහන :

බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයේ පුහුණු පාඨමාලා සඳහා ඇතුලත් කරගෙන ඇති පුහුණුලාභීන් සඳහා පමණක් අදාළ පාඨමාලා සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ලබා දෙනු ලබන පුහුණු සහතිකය ලබා ඇත්නම් ඉහත අධ්‍යාපන සුදුසුකම් නොසලකා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ .

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :

| බඳවා ගනු ලබන ශ්‍රේණිය | වෘත්තීය සුදුසුකම් | පුහුණු කාලය |
|---|---|---|
| පුහුණු කාල සීමාව | ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයෙන් තනතුරට අදාළ ක්ෂේත්‍රයක වසර 2 ½ කට නොඅඩු පූර්ණ කාලීන කාර්මික පාඨමාලාවක් හදාරා සහතික පත්‍ර ලබා ඇති අයෙකු වීම. | අවුරුදු 01 |

සටහන - අයදුම්පත් කැඳවනු ලබන දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගැනීමට ප්‍රමාණවත් පුහුණුලාභීන් සංඛ්‍යාවක් ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයේ නොමැති අවස්ථාවක පුරප්පාඩු පිරවීම සඳහා රජයේ පිළිගත් ආයතනයකින් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර 2 ½ නොඅඩු පූර්ණ කාලීන කාර්මික පාඨමාලා හදාරා සහතික පත්‍ර ලබා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.බඳවා ගැනීම් සිදු කිරීමේදී ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයේ පුහුණුලාභීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන අතර ඔවුන් බඳවා ගැනීමෙන් අනතුරුව ඉතිරිවන පුරප්පාඩු සඳහා අනෙකුත් ආයතනවලින් කාර්මික පාඨමාලා හදාරා සහතික පත්‍ර ලබා ඇති අයගෙන් බඳවා ගනු ලැබේ.

7.2.2.3 පළපුරුද්ද : තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර දුම්රිය රෙගුලාසි මාලාවේ දක්වා ඇති අක්ෂි දෘෂ්ටියක් සහිත විය යුතුය.

7.2.2.5 වෙනත් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 සිට 7.2.3 දක්වා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව: අවු.18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව: අවු. 45ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත තරග විභාගයක් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින්

7.2.4.1 ලිඛිත විභාගය :

| බඳවා ගන්නා ශ්‍රේණිය | විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| පුහුණු කාල සීමාව | සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| | තාක්ෂණ විෂය | 100 | 40 |

(ඇමුණුම - 01)

7.2.4.2.1 පවත්වන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය
ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු :අදාළ නොවේ

7.2.4.4යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : පුහුණු කාල සීමාවට අදාළව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය.

ලිඛිත තරග විභාගයෙන් සමත් වන අයදුම්කරුවන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර තරග විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව අයදුම්පත් කැඳවන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | 30 | |
| 3. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද | 30 | |
| 4. විශේෂ / බාහිර දක්ෂතා | 15 | |
| 5.සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද ආකල්ප හා පෞරුෂය | 05 | |
| එකතුව | 100 | |

සටහන :

ඉහත සඳහන් වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයන් ඇතුලත යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබන අතර එම විස්තරාත්මක ලකුණු දීමේ පරිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනය මඟින් ප්‍රසිද්ධ කළ යුතුය.

7.2.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් .

සංලක්ෂය :

| පුහුණු කාලය | සේවා ගිවිසුම පිළිබඳ විස්තරය | පුහුණු කාලය තුළදී දීමනාව | පුහුණුව අවසන් පරීක්ෂණය |
|---|---|---|---|
| අවුරුදු 01 යි | පුහුණු කාල සීමාවට බඳවා ගෙන III ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් III ශ්‍රේණියට පත් වීම ලද දින සිට වසර 10 ක කාලයක් අනිවාර්යයෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුවට සේවය කළ යුතුය. එසේ වසර 10ක සේවයට පෙර ඉවත්ව නොයන බවටත් ඊට පෙර සේවයෙන් ඉවත්ව යන්නේ නම් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් නිර්දේශ කරනු ලබන මුදලක් දෙපාර්තමේන්තුවට ගෙවීමට එකඟ බවටත් රජයේ සේවකයෙකු ඇප කරුවෙකු වශයෙන් ඉදිරිපත් කර වගකීමකට බැඳිය යුතුය. | පුහුණු කාලය තුළදී මාසික දීමනාවක් ගෙවනු ලැබේ. | පුහුණුව අවසානයේදී ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කර සමත් වූ අය III ශ්‍රේණියට පත් කරනු ලැබේ. පළමුවර පුහුණුව අවසන් පරීක්ෂණය අසමත් වූ අයට නැවත පැවැත්වෙන පුහුණු අවසන් පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සඳහා අවස්ථා 02 ක් ලබා දෙන අතර ඉන් අසමත් වන අයගේ සේවය අවසන් කරනු ලැබේ. (පුහුණු කාල සීමාව අවසානයේ විවෘත බඳවා ගැනීම් යටතේ පවත්වනු ලබන ලිඛිත විභාගය ඇමුණුම 03න් ද ප්‍රායෝගික පරීක්ෂණයට අදාළ විස්තර අමුණුම 04 න් ද සීමිත බඳවා ගැනීම් යටතේ ප්‍රායෝගික පරීක්ෂණය ඇමුණුම 05 න් දක්වා ඇත) |

## 7.3 සීමිත බඳවා ගැනීම :

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය :III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) යන විෂයයන් ඇතුළුව විෂයන් 06 කින් සමත්ව ඒ අතුරින් විෂයන් 02 ක් සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

සටහන :

වසරක පුහුණු කාලසීමාවක් සඳහා බඳවා ගනු ලබන අතර 7.2.5 හි සංලක්ෂය යටතේ දක්වා ඇති පුහුණු කාලය සඳහා වන කොන්දේසි අදාළ වේ. එම කොන්දේසි සපුරාලීමට නොහැකි නිලධාරීන් පෙරළා තමන් දැරූ තනතුරට යවනු ලැබේ.

7.3.2.3 පළපුරුද්ද :

| තනතුර | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (යාන්ත්‍රික) | දුම්රිය තාක්ෂණ ශිල්පී සහායක තනතුරේ වසර දහය (10) ක සක්‍රීය සේවා කාලයක් සහ පූර්වායන්න වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු වීම. |
| දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (විදුලි) | |

7.3.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :

i. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

ii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.දුම්රිය රෙගුලාසි මාලාවේ දක්වා ඇති අක්ෂි දෘෂ්ඨියක් සහිත විය යුතුය

7.3.3 වයස : අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :

අදාළ තනතුරුවල පුරප්පාඩු සඳහා උප දෙපාර්තමේන්තු මට්ටමින් පුරප්පාඩු කැඳවා අයදුම්කරුවන් ලිඛිත තරග විභාගයකට යොමු කර ඉන් සමත්වන අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. එම ලිඛිත තරග විභාගයේ සහ වෘත්තීය පරීක්ෂණයේදී ලබා ගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව බඳවා ගැනේ.

7.3.4.1 ලිඛිත විභාගය :

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| තාක්ෂණ විෂය | 100 | 40% |

(ඇමුණුම - 02)

7.3.4.1.1 පවත්වන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය :

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| තනතුරට අදාළ දැනුම මැන බැලීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ. | 100 | 40% |

7.3.4.2.1 පවත්වන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :අදාළ නොවේ.

7.3.4.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :ප්‍රසිද්ධ අභ්‍යන්තර නිවේදනය මගින් හා දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් නිකුත් කරනු ලබන දෙපාර්තමේන්තු චක්‍රලේඛනයක් මගින්

7.4 **කුසලතා පදනම මත බඳවා ගැනීම :** අදාළ නොවේ

## 08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය /සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් (ඇමුණුම 06 ) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් (ඇමුණුම 07 ) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගත වීමට පෙර | ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් (ඇමුණුම08 ) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද: වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

| | |
|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම<br>2 වන කාර්යක්ෂමතා කඩඉම<br>3වන කාර්යක්ෂමතා කඩඉම | දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් |

## 09. භාෂා ප්‍රවීණතාව :

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුල ලබාගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබාගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම් :

### 10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

**10.1.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව,**

**10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :**

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක (10) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත් කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

**10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියටඋසස් කිරීම**

**10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව,**

**10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :**

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක (10) ක් උපයාගෙන තිබීම.

II. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

සංලක්ෂය :

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

## 11. තනතුරුවලට පත් කිරීම :

| අනුමත තනතුරු නාමය | සුදුසුකම් | තෝරා ගනු ලබන ආකාරය |
|---|---|---|
| දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (පරීක්ෂක) | දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර I ශ්‍රේණියේ නිලධාරියකු වීම | ලිඛිත විභාගයක් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගනු ලැබේ. (ඇමුණුම 02 ) |
| දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (පරිපාලක) | දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර I ශ්‍රේණියේ නිලධාරියකු වීම . | ලිඛිත තරඟ විභාගයක් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගනු ලැබේ. (ඇමුණුම 02) |
| දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (උපදේශක) | දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර I ශ්‍රේණියේ නිලධාරියකු වීම | ලිඛිත විභාගයක් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගනු ලැබේ . (ඇමුණුම 02 ) |

සටහන - ලිඛිත විභාගයේ හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ මුළු ලකුණුවල එකතුවේ වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.පොරොත්තු ලේඛණවල තබා බඳවා ගැනීමක් සිදු කරනු නොලැබේ.

I වන ශ්‍රේණියේ නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී සේවා අවශ්‍යතාවය අනුව II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ඉහත වගුවේ සඳහන් පරිදි ලිඛිත විභාගය හා සම්මුඛ පරීක්ෂණය පවත්වා සුදුසුකම් ලබන නිලධාරීන් කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු පවතින තනතුරුවලට පත් කිරීම දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් සිදු කරනු ලැබේ.

## 12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :අදාළ නොවේ

## 13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපන වලට **පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන :**

I "සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයක් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මන්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත් , නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ."

## 14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : ඇමුණුම් අංක 09

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 **දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.**

16. **මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.**

17. අන්තර් කාලීන විධිවිධාන : අදාළ නොවේ.

යොජ කළේ : අත්සන : ..........................

නම : ..........................

තනතුර : ..........................

දිනය : ..........R.A.T.C. WEERASEKARA

Administration Officer (Appointment) Covering
Sri Lanka Railways
Maradana, Colombo - 10.

දිනය : 2017/09/18

පරීක්ෂා කළේ : අත්සන : ..........................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම: ..........................

තනතුර : ..........................

දිනය: ..........................

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..........................

තනතුර : ..........................

නිල මුද්‍රාව : ..........................

යොමුඅංකය : MT/03/12/01/02-MT 02

දුම්රිය දෙපාර්තමේන්තුවෙහි දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන: ..........................

නම: ..........................

ලේකම්

ජී. එස්. විතානගේ
ලේකම්
..........................අමාත්‍යාංශය

නිල මුද්‍රාව : ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
7 වන මහල, සෙත්සිරිපාය (අදියර II)
බත්තරමුල්ල

දිනය: 2017.09.26

යොමුඅංකය : PSC/EST/04-01-43/09/2016

දුම්රිය දෙපාර්තමේන්තුවේ ............... හි කළමනාකරණ සහකාර තාක්ෂණික ශ්‍රේණිය-2 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය ......2017.09.15...... දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..........................

නම: ..........................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිල මුද්‍රාව : ..........................

ඒ. කුලතුංග
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට.
කොළඹ - 05.

දිනය : 2017/10/25

ඇමුණුම 01

01. විභාගයේ නම :දුම්රිය දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය - 2 සේවා ගණය සඳහා වන දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර තනතුරු සඳහා විවෘත ධාරාව යටතේ පුහුණු කාලසීමාවට සුදුස්සන් තෝරා ගැනීමේ තරඟ විභාගය.

02. විභාග පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| තාක්ෂණ විෂය | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා :දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04 පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු ඇතිවීම මත තීරණය වේ.

05 විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා වාසය කරන හා සේවය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනමය දැනුම හා ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත්වන නූතන කරුණු මෙන්ම ඓතිහාසික කරුණුද, විද්‍යාත්මක, භෞතික හා කාර්මික සංවර්ධනය හා සම්බන්ධ අපේක්ෂකයෙකු සතු දැනුම හා අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය, නිවැරදි සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනීම හා බුද්ධිය පිළිබඳ මැනීමක් කිරීම අරමුණු කොටගෙන ගණිත ගැටළු, සාමාන්‍ය දැනීම හා පරිසරය ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් ව්‍යුහගත මාදිලියේ ලිඛිත විභාගයකි. |
| තාක්ෂණ විෂය | තනතුරට අදාළව දැනගත යුතු මූලික තාක්ෂණික න්‍යායික දැනුම මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ...........එම්. ඩී. අබේවික්‍රම.......

තනතුර : ........දුම්රිය සාමාන්‍යාධිකාරී.......
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය

නිල මුද්‍රාව : ........කොළඹ 10..........

දිනය 2017/09/18

**ඇමුණුම 02**

01. පරීක්ෂණයේ නම : දුම්රිය දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 2 සේවා ගණය සඳහා වන දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර තනතුරු සඳහා සීමිත බඳවා ගැනීම් යටතේ පුහුණු කාල සීමාවට බඳවා ගැනීමට සහ දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (පරීක්ෂක) , දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (පරිපාලක) , දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (උපදේශක ) තනතුරු වලට පත් කිරීමට අදාළ ලිඛිත විභාගය.

02. විභාගය පිළිබඳ විස්තර :

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| තාක්ෂණ විෂය | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා :දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු ඇතිවීම මත තීරණය වේ.

05. විභාගය සඳහා විෂය නිර්දේශය :

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| තාක්ෂණ විෂය | තනතුරට අදාළ තාක්ෂණ විෂය සම්බන්ධයෙන් දැනුම මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ........ එස්. එම්. අබේවික්‍රම

තනතුර : ........ දුම්රිය සාමාන්‍යාධිකාරී

නිල මුද්‍රාව : ........ දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, කොළඹ 10.

දිනය : 2017/09/18

01. විභාගයේ නම : දුම්රිය දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය - 2 සේවා ගණය සඳහා වන දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර තනතුරු සඳහා විවෘත ධාරාව යටතේ බඳවා ගන්නා ලද අයදුම්කරුවන් පුහුණු කාලයෙන් පසුව III ශ්‍රේණියට බඳවා ගැනීමට අදාළ ලිඛිත විභාගය.

02. විභාග පිළිබඳ විස්තර :

| විෂයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| තාක්ෂණ විෂය | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා :දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු ඇතිවීම මත තීරණය වේ.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| තාක්ෂණ විෂය | තනතුරට අදාළව දැනගතයුතු මූලික තාක්ෂණික දැනුම මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..........................................

තනතුර : ..........................................

නිල මුද්‍රාව : ..........................................

එස්. එම්. අබේවික්‍රම
දුම්රිය සාමාන්‍යාධිකාරී
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.

දිනය ...2017/09/18...

01. **පරීක්ෂණයේ නම :** දුම්රිය දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය - 2 සේවා ගණය සඳහා වන දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර තනතුරු සඳහා විවෘත ධාරාව යටතේ බඳවා ගන්නා අයදුම්කරුවන් පුහුණු කාලයෙන් පසුව III ශ්‍රේණියට බඳවා ගැනීමට අදාළ ප්‍රායෝගික පරීක්ෂණය.

02. **ප්‍රායෝගික පරීක්ෂණය පිළිබඳ විස්තර :**

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| තාක්ෂණ විෂය | 100 | 60 |

03. **ප්‍රායෝගික පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා :** දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. ප්‍රායෝගික පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය අනුව

05. **පරීක්ෂණය සඳහා විෂය නිර්දේශය :**

| විෂයන් | විෂය නිර්දේශය |
|---|---|
| තාක්ෂණ විෂය | තෝරාගත් විෂය පිලිබඳ නිපුණතාවය සහ තනතුරට අදාලව න්‍යායික දැනුම ප්‍රායෝගිකව හා නිවැරදිව භාවිතයට ගනු ලබන්නේදැයි මැන බැලීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..........................................

තනතුර : ..........................................

නිල මුද්‍රාව : ..........................................

එස්. එම්. අබේවික්‍රම
දුම්රිය සාමාන්‍යාධිකාරී
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.

දිනය : 14/09/18

**ඇමුණුම 05**

01 **පරීක්ෂණයේ නම :** දුම්රිය දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය - 2 සේවා ගණය සඳහා වන දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර තනතුර සඳහා සීමිත ධාරාව මගින් බඳවා ගන්නා අයදුම්කරුවන් පුහුණු කාලයෙන් පසුව III ශ්‍රේණියට බඳවා ගැනීමට අදාළ ප්‍රායෝගික පරීක්ෂණය.

02 **ප්‍රායෝගික පරීක්ෂණය පිළිබඳ විස්තර :**

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| තාක්ෂණ විෂය | 100 | 40 |

03 **ප්‍රායෝගික පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා :** දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04 **ප්‍රායෝගික පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :** අවශ්‍යතාවය අනුව

05 **ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විෂය නිර්දේශය :**

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| තාක්ෂණ විෂය | තනතුරට අදාළ තාක්ෂණ විෂය සම්බන්ධයෙන් දැනුම මැන බැලීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ............................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ............................................

තනතුර : ............................................

නිල මුද්‍රාව : ............................................

එස්. එම්. අබේවික්‍රම
දුම්රිය සාමාන්‍යාධිකාරී
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.

දිනය : 2017/09/18

ඇමුණුම 06

01. විභාගයේ /වෘත්තීය පරීක්ෂණයේ නම : දුම්රිය දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය - 2 සේවා ගණය සඳහා වන 1වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02. විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර : මෙම කාර්යක්ෂමතා කඩඉම ප්‍රායෝගික පරීක්ෂණයකි.

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| ප්‍රායෝගික පරීක්ෂණය | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ප්‍රායෝගික පරීක්ෂණය | තනතුරට අදාල න්‍යායාත්මක දැනුම, එම වෘත්තියට අදාළ වන උපකරණ හා මෙවලම් හඳුනා ගැනීම හා භාවිතය, ඒවා තබා ගැනීම පිළිබඳව ඇති දැනුමත්, තනතුරට අයත් තෝරාගත් කාර්යයන් නිශ්චිත කාලසීමාවක් තුළදී නිවැරදිව හා කාර්යක්ෂමව ඉටු කරන ආකාරයේ ශිල්පීය දැනුම පරීක්ෂා කිරිම. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : .......... එස්. එම්. අබේවික්‍රම

තනතුර : .......... දුම්රිය සාමාන්‍යාධිකාරී

නිල මුද්‍රාව : .......... දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය කොළඹ 10.

දිනය : 2017/04/10

ඇමුණුම 07

01. විභාගයේ /වෘත්තීය පරීක්ෂණයේ නම : දුම්රිය දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය - 2 සේවා ගණය සඳහා වන 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර : මෙම කාර්යක්ෂමතා කඩඉම ප්‍රායෝගික පරීක්ෂණයකි.

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| ප්‍රායෝගික පරීක්ෂණයකි. | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ප්‍රායෝගික පරීක්ෂණයකි. | තනතුරට අදාල නිපුණතාවය මැන බැලීම සඳහා වාචික පරීක්ෂණයකින් සහ තනතුරට අදාල නවයකරණය වූ න්‍යායාත්මක ප්‍රායෝගික දැනුම, එම වෘත්තියට අදාළ වන නවීන තාක්ෂණික උපකරණ හා මෙවලම් හඳුනා ගැනීම හා භාවිතය, ඒවා නඩත්තු කිරීම පිළිබඳව ඇති දැනුමත්, තනතුරට අයත් තෝරාගත් කාර්යයන් නිශ්චිත කාලසීමාවක් තුළදී නිවැරදිව හා කාර්යක්ෂමව ඉටු කරන ආකාරයේ ශිල්පීය දැනුම පරීක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමන්විත වේ. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..................
තනතුර : ..................
නිල මුද්‍රාව : ..................

2017/09/18
..................

**ඇමුණුම 08**

1 විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : දුම්රිය දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය - 2 සේවා ගණය සඳහා වන 3වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2 විභාගය /වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර : මෙම කාර්යක්ෂමතා කඩඉම ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකි.

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන රෙගුලාසි දුම්රිය දෙපාර්තමේන්තුවට අදාල ආරක්ෂක රීති කර්මාන්ත ශාලා රෙගුලාසි | පැය 01 | 100 | 40 |
| ප්‍රායෝගික පරීක්ෂණය | | 100 | 40 |

3 පවත්වනු ලබන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

4 පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

5 **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන රෙගුලාසි දුම්රිය දෙපාර්තමේන්තුවට අදාලආරක්ෂක රීති කර්මාන්ත ශාලා රෙගුලාසි. | <u>ආයතන රෙගුලාසි :-</u><br>III වන පරිච්ජේදය -මාරු කිරීම්<br>XII වන පරිච්ජේදය - නිවාඩු<br>XIII වන පරිච්ජේදය - දුම්රිය බලපත්‍ර<br>XIX වන පරිච්ජේදය - රජයේ නිවාස<br>XLVIII වන පරිච්ජේදය - සාමාන්‍ය හැසිරීම හා විනය<br>දුම්රිය දෙපාර්තමේන්තුවට අදාල ආරක්ෂක රීති හා කර්මාන්තශාලා රෙගුලාසි පිළිබඳ දැනුම |
| ප්‍රායෝගික පරීක්ෂණය | තනතුරට අදාල නවයකරණය වූ න්‍යායාත්මක ප්‍රායෝගික දැනුම, එම වෘත්තියට අදාළ වන නවීන තාක්ෂණික උපකරණ හා මෙවලම් හඳුනා ගැනීම හා භාවිතය, ඒවා නඩාගැනීම පිළිබඳව ඇති දැනුමත්, තනතුරට අයත් තෝරාගත් කාර්යයන් නිශ්චිත කාලසීමාවක් තුළදී නිවැරදිව හා කාර්යක්ෂමව ඉටු කරන ආකාරයේ ශිල්පීය දැනුම පරීක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයකින්ද සමන්විත වේ. |

2017/07/18

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..............................................

තනතුර : ..............................................

නිල මුද්‍රාව : ..............................................

එස්. එම්. අබේවික්‍රම
ද්විතීය සාමාන්‍යාධිකාරී
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.

ක්‍රමයට අන්තර්ග්‍රහණය (බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින පමණක් අදාල වේ.)

මණ්ඩල සංදේශ අංක 15/0939/630/015 -1 සඳහා 2015.06.23 දිනැතිව ලබා දී ඇති අමාත්‍ය අනුමැතිය පරිදි MT - 02-2006 A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබා දී ඇති නිලධාරීන් දැනට දරණ තනතුරට අදාළ වන පරිදි දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර විදුලි/පරීක්ෂක/පරිපාලක/උපදේශක) යන තනතුරු වලට ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත්කරන ලද දිනය පදනම් කරගෙනය. සඳහන් අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ පියවරේ තැබීමද සිදු නොකළ යුතුය. අන්තර්ග්‍රහණය හේතු කොට ගෙන නිලධාරියාට හිමිව ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවයට හානියක් සිදු නොවේ.

(i). **MT 2 - III ශ්‍රේණිය**

(අ) බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට මූලික තාක්ෂණ සේවයේ II (ආ) ඛණ්ඩයේ සේවයේ නියුතු සියළුම නිලධාරීන්,

**MT 2 -** වැටුප් පරිමාණයේ **III** ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ii). **MT 2 - II ශ්‍රේණිය**

(අ) බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට මූලික තාක්ෂණ සේවයේ II (අ) ඛණ්ඩයේ සේවයේ නියුතු සියළුම නිලධාරීන්,

**MT 2 -** වැටුප් පරිමාණයේ **II** ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(iii ). **MT 2 - I ශ්‍රේණිය**

(අ) බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට මූලික තාක්ෂණ සේවයේ I පන්තියේ සේවයේ නියුතු සියළුම නිලධාරීන්,

**MT 2 -**වැටුප් පරිමාණයේ **I** ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

: බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට මූලික තාක්ෂණ සේවයේ II 'අ ' පන්තියේ වසර වැඩි සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන් දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර II අන්තර්ග්‍රහණය කරනු ලබන අතර පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් කර ඇති නිලධාරීන් එදිනට පසු දින සිට ක්‍රියාත්මක වන පරිදි I වන ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

නිලධාරීන් පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන දින සිට ක්‍රියාත්මක වන පරිදි I වන ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..............................................

තනතුර : ..............................................

නිල මුද්‍රාව : ..............................................

[illegible]
[illegible]
[illegible]
කොළඹ 10.